# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

### මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ මනෝවිද්‍යාව

### බෞද්ධ මනෝවිද්‍යාවේ මූලාශ්‍රය අධ්‍යයනය හා බෞද්ධ මනෝ - කායික විශ්ලේෂණයෙහි මූලිකාංග BUPS – 18224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. මිනිස් චර්යාවන් සහ මානසික සංවර්ධනය අතර පවතින සම්බන්ධතාව මිගසාලා සූත්‍රය ඇසුරින් අධ්‍යයනය කරන්න.

02. තිරෝකුඩ්ඩ සූත්‍රාගත ඉගැන්වීම් පුද්ගල මානසික සුවපත්භාවය විෂයෙහි ඉවහල් වන ආකාරය පරීක්ෂා කරන්න.

03. දෘෂ්ටිගතිකත්වයෙන් තොරවීම තුළින් උදාකරගත හැකි මානසික සංවර්ධනයේ ස්වභාවය අග්ගිවච්ඡගොත්ත සූත්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.

04. 'බෞද්ධ කර්ම සංකල්පය වනාහි පුද්ගල මනෝභාවයන් පදනම් කරගත් ඉගැන්වීමකි.' අංගුත්තර නිකායාගත නිබ්බේධික සූත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

05. නිවැරදි චර්යාවන් සකසා ගැනීම උදෙසා මනෝවිද්‍යාත්මක ක්‍රමවේදයන් උපයෝගී කරගත හැකි ආකාරය මහාරාහුලෝවාද සූත්‍රය ඇසුරින් පරීක්ෂා කරන්න.

06. බෞද්ධ මනෝකායික විශ්ලේෂණයන්හි ස්වභාවය ඛන්ධ, ආයතන, ධාතු විග්‍රහයන්ට සාපේක්ෂව විමර්ශනය කරන්න.

07. ඉන්ද්‍රිය සංජානන ක්‍රියාවලියට අදාළ වන ප්‍රධාන මානසික ක්‍රියාකාරීත්වයන් මොනවාදැයි සූත්‍ර දේශනා ඇසුරින් පැහැදිලි කරන්න.

08. මානව අභිප්‍රේරණ සම්බන්ධයෙන් සතර කර්ම ක්ලේශයන්ගේ කාර්යභාරය වර්තමාන සමාජ ප්‍රවණතා ඇසුරින් ප්‍රකට කරන්න.

09. මානසික සංඝටක පිළිබඳ ථෙරවාද බෞද්ධ විග්‍රහය කෙටියෙන් දක්වන්න.

10. වර්තමාන සමාජ සම්මත මානසික ප්‍රශ්න අකුශල චෛතසික හා කෙතෙක් දුරට සංසන්දනය කළ හැකිදැයි පරීක්ෂා කරන්න.

************************************